දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්
First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

# භූවිප්‍ර 1.1 - මානව භූගෝල විද්‍යාව
# GY 1.1 – Human Geography

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

01. භූගෝල විද්‍යාව විෂය පථය කෙරෙහි අනන්‍යතාව ලබා දෙන ප්‍රධාන තේමාව නොවෙනස්ව පවත්වා ගනිමින්, මානව භූගෝල විද්‍යා විෂය ක්ෂේත්‍රය විවිධ සම්ප්‍රදායන්, සංකල්ප හා න්‍යායන් මත වර්ධනය වී තිබේ. මෙම ප්‍රකාශනය උචිත නිදසුන් මගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. (i) ගෝලීය ජනගහන වර්ධනයේ වත්මන් ස්වභාවය හඳුන්වන්න.

(ලකුණු 04)

(ii) අධික ජනගහනයක් වාසය කරන රටවල, එයට බලපා ඇති හේතු 4 ක් සහ අධික ජනගහනය හේතුවෙන් ඇති වී තිබෙන ප්‍රතිඵල 4 ක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 16)

03. (i) ඩී. විට්ල්සි (D. Whittlesy) විසින් 1936 දී පෙන්වා දී ඇති ගෝලීය කෘෂි අර්ථ ක්‍රම වර්ගීකරණය කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 02)

(ii) සාර්ක් කලාපීය (SAARC Region) රටවල් නම් කොට, ඒවයේ දක්නට ලැබෙන කෘෂි අර්ථ ක්‍රම පෙන්වා දෙන්න.

(ලකුණු 02)

(iii) ඔබ විසින් නම් කළ අර්ථ ක්‍රම අතරින් දෙකක් (02) තෝරා ගෙන, එහි මූලික ලක්ෂණ හා නූතන ප්‍රවනතා විභාග කරන්න.

(ලකුණු 16)

04. විවිධ බලශක්ති මූලාශ්‍ර හඳුන්වා දී, ගෝලීය බල ශක්ති පරිහරණයේ දක්නට ලැබෙන විෂමතා විවිධ බලශක්තීන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. (අ) සංවර්ධනය පිළිබඳ පහත දැක්වෙන සංකල්ප, නිර්වචන ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

i. ආර්ථික වර්ධනය
ii. ආර්ථික සංවර්ධනය
iii. මානව සංවර්ධනය
iv. තිරසර සංවර්ධනය
v. අධ්‍යාත්මික සංවර්ධනය

(ලකුණු 10)

(ආ) මානව සංවර්ධන දර්ශකය මිනුම් කරන ආකාරය පැහැදිලි කොට, ඒ පිළිබඳව එල්ල වී ඇති විවේචන පෙන්වා දෙන්න.

(ලකුණු 10)

06. (i) ජාත්‍යන්තර වෙළඳාම යනු කුමක්දැයි හඳුන්වා එහි අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) ජාත්‍යන්තර වෙළඳාමෙහි වාසි කවරේදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 06)

(iii) ජාත්‍යන්තර වෙළඳාමෙහි රජයේ දායකත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

07. (i) නිර්වචන ඇසුරින් ගෝලීයකරණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) ගෝලීයකරණය උදෙසා බහුජාතික සංගම්වල කාර්යභාරය පෙන්වා දෙන්න.

(ලකුණු 06)

(iii) සංවර්ධනය වන රටවල් කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම විමසන්න.

(ලකුණු 08)

08. (i) උචිත රූප සටහන් ඇසුරින්, ජන විද්‍යාත්මක සංක්‍රාන්ති න්‍යාය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) පසුගිය වසර 80 ක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇති වූ ජන විද්‍යාත්මක පරිවර්තනය, ජන විද්‍යාත්මක සංක්‍රාන්ති න්‍යාය ඇසුරින් පැහැදිලි කළ හැකි දැයි විමසන්න.

(ලකුණු 10)

****************************************